TRANSPARENCY INTERNATIONAL SRI LANKA

a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපළ සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර, කොළඹ 05.
2019.10.19.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි ,

**<u>එක් දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීම සදහා පහසුකම්, ප්‍රදාන ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධවයි.</u>**

ඉදිරි මාස දෙක ඇතුලත රුපියල් මිලියන 11 400 ක් තරම් වූ දැවැන්ත ණය මුදලක් ව්‍යවසායකයන් 17 500 ක් වෙත එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රම ඔස්සේ පිරිනැමීමට කටයුතු කරන බවට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති නීතිඥ සුජිත් ප්‍රසන්න මහතා කියා සිටි බව 2019 ඔක්තෝම්බර් 19 දින දිනමිණ පුවත්පත වාර්තා කර ඇත.

මෙසේ මැතිවරණ කාල සීමාව තුළ දී ණය මුදල් ප්‍රදානය කිරීම මගින් එක් විශේෂ දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වීමේ හැකියාව ඇති අතර මැතිවරණ සමයේ මෙවැනි කටයුතු සිදු කිරීම 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 4(iii) යටතේ නීති විරෝධී වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බලා අවශ්‍යය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංඛී අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතාගේ 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි.පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේදී පොදු දේපල අවභාවිතා වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි .

මෙයට,

විශ්වාසී.

Lakvijaya Bandara

............................

ලක්විජය බණ්ඩාර .

ජාතික සම්බන්ධීකාරක.(PPPR)